හදිසි ප්‍රකාශණය සඳහා

# ශ්‍රී ලංකාව: කරුණා පාර්ශවය හා එල්ටීටීඊය ළමුන් පැහැරගැනීම් හා බලෙන් බඳවා ගැනීම් අඛණ්ඩව සිදු කරයි.

***කරුණා කණ්ඩායමේ ක්‍රියාව නැවැත්වීමට හෝ පරීක්ෂණ පැවැත්වීමට රජය අපොහොසත් වේ.***

(නියූ යෝක්, මාර්තු 29, 2007) ආණ්ඩුවට පක්ෂපාතී කරුණා පාර්ශවය විසින් කරගෙන යනු ලබන බලයෙන් පැහැරගැනීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීමට පොරොන්දු වී තිබුනද ශ්‍රී ලංකා බලධාරීන් විසින් තවමත් එය සම්බන්ධව කිසිදු ඵලදයී ක්‍රියාමාර්ගයක් නොගැනීමෙන්, දිගින් දිගටම පැහැරගැනීම් සිදුවෙමින් පවතින බව මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය අද දින පැවසීය. ශ්‍රී ලංකා රජයට විරුද්ධව සන්නද්ධ වී සටන් කරන දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයද (එල්ටීටීඊ) අඛණ්ඩව කුඩා ළමුන් බඳවාගෙන, ඔවුන් සොල්දාදුවන් වශයෙන් යොදවා ගනු ලබයි.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පිහිටි මඩකලපුව දිස්ත්‍රික්කයේ, කරුණා පර්ශවයේ දේශපාලන පක්ෂය වූ දෙමළ ජනතා විමුක්ති කොටි සංවිධානයට (ටීඑම්වීපී) අයත් කාර්යාල වල පැහැදිලිවම වයස අවුරුදු 17 න් පහල ළමුන්ද, ඔවුන්ගෙන් සමහරු රයිපල් තුවක්කු ඇතිවද මුර කාවල් වල යෙදෙන බව මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය සාක්ෂි දරයි. ශ්‍රී ලංකා හමුදාවේ සොල්දදුවන් හා පොලීසිය නිති පතා එම ළමුන් අසලින් වාහන වලින් සහ පයින් ගමන් කලද පෙනිය හැකි කිසිදු ක්‍රියාමාර්ගයක් නොගනී.

එම කණ්ඩායමේ නායකයා වන කර්නල් කරුණා යනුවෙන් හඳුන්වන ලබන වී. මුරලිදරන්ගේ උපන් ගම වූ කිරාන් වල පිහිටි ටීඑම්වීපී කාර්‍යාලයේද රයිපල් තුවක්කු සහිත කුඩා ළමයෙක් මුරකටයුතු වල යෙදී සිටි අයුරු මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය විසින් දක ඇත. මඩකලපු දිස්ත්‍රික්කයේ, හමුද කඳවුර පිහිටි ස්ථානයේ මාර්ගයෙන් අනෙක් පස ටීඑම්වීපී කාර්‍යාල පිහිටි වාලච්චේන සහ මොරකොට්ටන්චේන ඇතුළුව අනිකුත් ශ්‍රී ලංකා හමුද කඳවුරු වල ද තවත් ළමුන් පිරිසක් ආයුධ සන්නද්ධව ගැවසීම දක්නට ඇත.

"මෙම කඳවුරු වල සිට රජයේ හමුදවන් මාර්ගයෙන් එපිට බලද්දී කරුණා පාර්ශවයේ කාර්යාල වල කුඩා ළමුන් මුර කටයුතු වල යෙදී සිටීම පෙනුනද, ඒ සම්බන්ධව හමුදව කිසිදු පියවරක් නොගෙන සිටීම නිසාවෙන්, මෙම අපචාරී ක්‍රියාව අවසන් කිරීමට රජය යම්කිසි ඵලදයී ක්‍රියාමාර්ගයක් ගනු ලබන බව විශ්වාස කිරීම අපහසුයි." යැයි ද, මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානයේ ආසියාතු කලාප අධ්‍යක්ෂ බ්‍රැඩ් ඇඩම් පැවසීය. රජයේ අනුග්‍රහය සහිතව කරුණා පාර්ශවය විසින් ළමුන් සොල්දදුවන් ලෙස යොද ගැනීමේ ක්‍රියාවලිය පෙරටත් වඩා කිසිදු විචිකිච්ඡාවකින් තොරව සිදුවෙමින් පවතින බවද ඔහු තවදුරටත් පැවසීය.

කරුණා පාර්ශවය විසින් කෙරෙනු ලබන පැහැර ගැනීම් වලට රජයේ අනුග්‍රහය ලැබෙ යැයි නගනු ලබන චෝදන සම්බන්ධයෙන් රජය නිසි පරීක්ෂණ පවත්වා, ආරක්ෂක අංශයට අයත් කිසිදු පුද්ගලයෙකු නීතිය උල්ලංඝණය කර ඇත්නම් එයට ඔහු වග උත්තර කරුවෙකු ලෙස පත්කරන බවද ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ශ්‍රී ලංකාවේ නිලධාරීන් දිගින් දිගටම පවසා තිබුනද මේ වනතුරු ඒ සම්බන්ධව කිසිදු ඵලදයී කියාමාර්ගයක් ආණ්ඩුව විසින් ගෙන නැත. යුනිසෙෆ් ආයතනයේ

තොරතුරුවලට අනුව, මාස 3 ක් ඇතුළත එනම් දෙසැම්බර් මාසයේ 10 දෙනෙකුද ජනවාරි මාසයේ 24 දෙනෙකුද පෙබරවාරි මාසයේ 11 දෙනෙකුද, කරුණා පාර්ශවය විසින් ළමුන් බලයෙන් පැහැරගොස් ඇති බවට සිද්දීන් 45 ක් වාර්තා වී ඇත. මෙයින් ළමයින් තුන් දෙනෙක් මඩකලපු දිස්ත්‍රික්යේ අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන් ජීවත්වන කඳවුරුවලින් පැහැරගෙන ගොස් ඇත. පැහැරගැනීම් සම්බන්ධව පැමිණිළි කිරීමට බොහෝ දෙමාපියන් බියවෙන හෙයින් සැබෑ සංඛ්‍යාව මීටත් වඩා ඉහළ යා හැකිය. තවද කරුණා පාර්ශවය විසින් කෙරෙන බලයෙන් බඳවා ගැනීමට අසුවන වයස අවුරුදු 17 න් ඉහළ තරුණයන්ගේ සංඛ්‍යාව මෙයට ඇතුළත් වී නැත.

දෙසැම්බර් මාසයේ සිට අවම වශයෙන් ළමුන් 12 දෙනෙකුට ආසන්න පිරිසක් කරුණා පාර්ශවය මුදා හැර ඇත. එහෙත් එයින් අවම වශයෙන් තිදෙනෙක් නැවත බඳවා ගෙන ඇත. මෑත සතිවල කරුණා පාර්ශවය විසින් තමන්ගේ දරුවන් කුමන ආකාරයකින් පැහැර ගෙන යනු ලැබුවේදයි, පැහැර ගැනීමට ලක් වූ ළමයකුගේ සහ තරුණයන් දෙදෙනෙකු ගේ දෙමව්පියන් විසින් පෙබරවාරි මාසයේදී මානව හිමි කම් නිරීක්ෂණ සංවිධානයට විස්තර කලහ. ප්‍රථම සිද්ධියේදී කරුණා කණ්ඩායම එම ළමයා ජූලි මාසයේදී පළමුව පැහැරගෙන ඇති අතර, පසුව ඔහුට පවුලේ අය බැලීමට යාමට අවසර දී, සතියකින් පසුව නැවත පැමිණ රැගෙන ගොස් ඇත. දෙවන සිද්ධියේදී වැලිකන්ද හා වාලච්චේන අතර තිබෙන ඒ 11 මාර්ගයේදී එම තරුණයන් දෙදෙනා කරුණා පාර්ශවයේ සාමාජිකයන් විසින් පැහැර ගෙන ගොස් ඇත. එම තිදෙනාගේ ඥාතීන් කරාපොලට නුදුරින් පිහිටි කරුණා පාර්ශවයේ කඳවුරට පැමිණිලි කල විට එම සිද්ධිය වාර්තා නොකරන ලෙසත්, එසේ නැත්නම් එම දරුවන් එල්ටීටීඊ සංවිධානය විසින් පැහැරගෙන ගිය බවට ප්‍රකාශ කරන ලෙසට එහි සාමාජිකයන් පවසා ඇත.

එය එසේ තිබියදී, එල්ටීටීඊ සංවිධානය ද කාන්තාවන් සහ ගැහැණු ළමුන් ඇතුළු ළමුන් සහ තරුණයින් බලයෙන් පැහැරගෙන ගොස් තම සංවිධානයට බඳවා ගැනීම අඛණ්ඩව කරගෙන යන බව මානව හිමි කම් නිරීක්ෂණ සංවිධානය පවසයි. එල්ටීටීඊ සංවිධානය ජනවාරි මාසයේදී 19 දෙනකුත් පෙබරවාරියේදී 9 දෙනකුත් කුඩා ළමුන් පැහැරගෙන ගොස් ඇති බව යුනිසෙෆ් ආයතනය ලේඛණගත කොට ඇත. අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් ජීවත්වන කඳවුරුවලින්ද අවම වශයෙන් ළමුන් 4 දෙනෙක් එල්ටීටීඊ සංවිධානය විසින් පැහැරගෙන ගොස් ඇත.

එල්ටීටීඊ පාලන පෙදෙසට ඇතුලු වීම තවමත් අසීරු වී ඇති නමුත්, නැගෙනහිර ප්‍රදේශයේ එල්ටීටීඊ සංවිධානය විසින් ගැහැණු ළමයින් බඳවා ගැනීම වැඩි වී ඇති අතර, ඔවුන් ඉදිරි සටන් සොල්දාදුවන් ලෙස භාවිතා කරන බවද විශ්වාසදායි වාර්තා වලින් දක්වේ. මඩකලපු දිස්ත්‍රික්කයේ තොප්පිගල ප්‍රදේශයේ මෑතක පැවති සටන් වලදී එල්ටීටීඊය වෙනුවෙන් සටන් කල ගැහැණු ළමුන් අවම වශයෙන් තිදෙනෙක් මිය ගොස් ඇති බව වාර්තා වී ඇත.

එල්ටීටීඊ සංවිධානය විසින් ළමුන් සොල්දාදුවන් ලෙස යොදා ගැනීම, මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය නිරන්තරයෙන් හෙලා දක ඇති අතර ඒවා ලේඛණ ගත කොටද ඇත. එල්ටීටීඊය දීර්ඝ කාලයක් තිස්සේ ජාත්‍යන්තර නීති උල්ලංඝණය කරමින් ළමා සොල්දාදුවන් බඳවා ගැනීමේ නියැලී සිටින බැවින් එම සංවිධානය ඉලක්ක කොට නිශ්චිත සම්බාධක පමුණුවන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙතින් මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය ඉල්ලා ඇත.

"එල්ටීටීඊ සංවිධානය, අඛණ්ඩව ළමුන් සොල්දාදුවන් ලෙස බඳවා ගැනීමේ නියැලීමෙන් අපකීර්තිමත් චූදිතයෙක් වී ඇත" යැයි ඇඩම් පවසයි. නමුත් කරුණා පාර්ශවයට අනුග්‍රහය දක්වමින් රජයේ හමුදාවන්ද එම නින්දිත ක්‍රියාවලියේ නියැලී සිටීම ලැජ්ජාසහගත යැයි ද තව දුරටත් ඔහු පැවසීය.

කරුණා පාර්ශවය විසින් කරන ලද නීති විරෝධී කටයුතුවලට රජයේ හමුදාව දන් විවෘතවම සහයෝගය දක්වන බවට බලවත් සාක්ෂි ඇති බව මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය පවසයි. මඩකලපු දිස්ත්‍රික්කය පුරාම කරුණා පාර්ශවයේ සාමාජිකයින් ආයුධ සන්නද්ධව රජයේ ආරක්ෂක අංශවලට පෙනෙන ආකාරයට ප්‍රසිද්ධියේ සැරිසැරීම දක්නට ඇත.

කරුණා පාර්ශවයේ අන දෙන නිළධාරියෙකු වන ජෙයම් රජයේ හමුදවට අයත් සන්නද්ධ රථයක නැගී වාලච්චේනයට පිටත ගමන්කරන අයුරු මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය දක ඇත. කරුණාගේ බටයන් පොලීසිය සමග එක්ව මුර සංචාරයේ යෙදෙන අයුරුද මඩකලපු නගරයේ පදිංචි කරුවන් දක ඇත.

මඩකලපු නගරයට වයඹ දෙසින් කිලෝමීටර් 50 ක් පමණ දුරින්ද, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද නගරයට ඊසාන දිගින් කිලෝමීටර් 10 පමණ දුරින් පවතින කැලෑ සහිත ප්‍රදේශ තුල කරුණා පාර්ශවය අවම වශයෙන් කඳවුරු පහක් පමණ පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා පාබල හමුදවේ 23 වන කණ්ඩය පිහිටා තිබෙනුයේ වැලිකන්දෙහිය. නැගෙනහිර දිස්ත්‍රික්කවල සිට වැලිකන්ද දක්වා දිවෙන A11 මාර්ගය මෙහි පිහිටා තිබෙන බැවින් මෙම ප්‍රදේශය දැඩි ආණ්ඩු පාලනය යටතේ පවතී. මුතුගල ගම්මානයේ කරුණාගේ කඳවුරු පිහිටා ඇත්තේද ශ්‍රී ලංකා හමුදවේ මුර පොලක් අසලය.

කරුණා පාර්ශවය සහ එල්ටීටීඊ සංවිධානය විසින් ළමුන් බලයෙන් පැහැරගෙන ගොස් හමුදවට බඳවා ගැනීම පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ස්වාදීන ප්‍රභවයන් විසින් ලබාදී ඇත. සන්නද්ධ ගැටුම් හා ළමුන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ උපදේශක ඇලන් රොක් නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ කරන ලද සංචාරය පදනම් කොටගෙන, රජයේ අනුබල සහිතව කරුණා පාර්ශවය ළමුන් බලහත්කාරයෙන් පැහැරගෙන යාම සහ එල්ටීටීඊ ය ළමුන් සොල්දදුවන් ලෙස බඳවා ගැනීම පිළිබඳවද අරක්ෂක කවුන්සිලයට වාර්තා කර ඇත. කරුණා පාර්ශවය විසින් කරන ලද පැහැරගෙන යාම් සම්බන්ධව මානව හිමිකම් සංවිධානය විසින් රජයට ලබා දුන් පිටු 100 ක වාර්තාව **"අපරාධයට අනුබල දීම: පැහැර ගැනීම් වල කොටස්කරුවකු ලෙස රජය සහ ළමුන් හමුදවට බඳවා ගන්නා කරුණා පාර්ශවය"** යන නමින් ජනවාරි මාසයේදී ප්‍රකාශයට පත් විය. ආණ්ඩුවේ පාලනය පවතින ප්‍රදේශවල, නීතියට බිය නොවෙන ආකාරයට කරුණා පාර්ශවයේ හට පිරිස් ක්‍රියාත්මක වන ආකරයද ළමුන් සහ තරුණ පිරිස් පැහැරගෙන ගොස් ඔවුන් කඳවුරුවල රඳවා පුහුණු කරමින් සන්නද්ධ ගැටුම් වල යොදවන ආකාරය පිළිබඳවද මෙම වාර්තාව, සිද්ධි අධ්‍යයන, සිතියම් සහ ඡායාරූප සහිතව පෙන්වා දෙනු ලබයි.

"පරීක්ෂණ කටයුත ආරම්භ කිරීමට තමන්ට ප්‍රමාණවත් සාක්ෂි අවශ්‍ය වන බව ආණ්ඩුව පවසයි. එහෙත් දනටමත් බොහෝ තොරතුරු ඔවුන් සතුව ඇත." යැයි, ඇඩම් පවසයි. "එක්සත් ජාතීන්ගේ ලේඛණ සහ අපගේ වාර්තාවල සඳහන් වී ඇති කට උත්තර වලට අමතරව බොහෝ පවුල් විසින් විධිමත් ලෙස පොලීසියට කරන ලද පැමිණිලි ද මවුන් සතුව ඇත."

රට පුරා සිදු කෙරෙමින් පවතින අතුරුදහන් කිරීම් සහ පැහැර ගැනීම් ගැන සොයා බැලීමට ඒක පුද්ගල කොමිසමක් පසුගිය වසරේ දී ජනාධිපති රාජපක්ෂ විසින් පිහිටුවන ලදි. මෙම කොමසාරිස්වරයාගේ පළමු සංචාරය කිසිදු දන්වීමකින් තොරව අවලංගු කිරීමෙන් අනතුරුව මාස දෙකකට පසු ඔහු මඩකලපුවට පැමිණ ඇත. මොහුගේ පැමිණීම පිළිබඳව දරුවන් අතුරුදහන් වූ පවුල් වලට නිසිලෙස දනුම් නොදීමේ හේතුවෙන්ද ඔහු හමුවන ස්ථානය අවසන් මොහොතේ වෙනස් කිරීමෙන්ද ඔවුන්ට එම ස්ථානය සොයා ගැනීමට නොහැකි වී ඇත. සමහරුන් කොමසාරිස්වරයා මුණ ගැසී ඇත. එහෙත් ඔවුන් තොරතුරු සැපයීම ඔහුගේ කාර්‍ය මණ්ඩලය විසින් වළක්වා ඇත.

කරුණා පාර්ශවය විසින් පැහැරගන්නා ලද සමහර ළමුන්ගේ මව්වරුන්, දෙසැම්බර් මාසයේදී හමුදව විසින් තම කඳවුරුවලට කැඳවා එම පැහැරගැනීමේ සිද්ධි සම්බන්ධව තොරතුරු සපයන ලෙස ඉල්ලා ඇත. නමුත් තමන්ගේ දරුවන්, "නාඳුණන කණ්ඩායමක් විසින්" පැහැරගෙන ගොස් ඇති බව පවසන ලෙස එම මව්වරුන්ට හමුදව විසින් බලපෑම් කර ඇත.

තමාගේ බට පිරිස් ළමුන් පැහැර ගෙන ගොස් බලයෙන් බඳවා ගන්නා බවට කරන ලද චෝදනා කරුණා ප්‍රතික්ෂේප කර ඇත. මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය සමග පෙබරවාරි 9 දින ඔහු විසින් කරන ලද දුරකථන සංවාදයේදී, තම හමුද බලකායේ වයස අවුරුදු 18 න් පහල කිසිදු සාමාජිකයෙක් නැති බවත් එම වයසට අඩු ළමුන් බඳවා ගැනීමට තැත්කරන තමන්ගේ ඕනෑම අන දෙන නිළධාරියෙක් විනය ගරුක කිරීමට තමන් පියවර ගන්නා බවද ඔහු පැවසීය.

තම සංවිධානයේ හමුද අංශයට ටීඑම්වීපී විසින් නීති මාලාවක් නිකුත් කර ඇති අතර තම සංවිධානයට සාමාජිකයින් බඳවා ගන්නා අවම වයස සීමාව 18 බව ද එහි සඳහන් වී ඇති අතර ළමුන් බඳවා ගන්නා සාමාජිකයන්ට පමුණුවන දඬුවම්ද එහි නිශ්චිතව සඳහන් කර ඇත. එම නීති මාලාව වැඩි දියුණු කිරීම සඳහා සාකච්ඡා කිරීමට කරුණා කැමැත්ත දක්වුවද ආරක්ෂක හේතු මත පූර්ව දැනුම් දීමකින් තොරව තම කඳවුරු වලට පැමිණීමට ඉඩ දීමට අපහසු බවද ඔහු පවසා ඇත.

මෑත කාලයේදී මඩකලපු දිස්ත්‍රික්කය තුළ කරන ලද ළමුන් පැහැර ගැණීම් සම්බන්ධව නැගෙන චෝදනාවන් පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාරය ඉල්ලමින් ටීඑම්වීපී වෙත මානව හිමිකම් නිරීක්ෂන සංවිධානය ලිඛිතව දැනුම් දුන්නේය. එහෙත් මාර්තු 28 තෙක් ටීඑම්වීපීය එයට පිළිතුරක් එවා නැත.

"ආණ්ඩුවේ නීච ක්‍රියා කරුණා පාර්ශවය ඉටු කරයි" යැයි ඇඩම් පවසයි. "එම කණ්ඩායම කුඩා ළමුන් හමුදා භටයන් ලෙස භාවිතා කිරීම කොළඹ නිලධාරීන් විසින් නතර කර දැමීමට නිසි කාලය දැන් එළඹ ඇත".

**2007 ජනවාරියේ මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද, "අපරාධයට අනුබල දීම: පැහැරගැනීම් වලට කොටස් කරුවෙකු ලෙස රජය සහ ළමුන් හමුදවට බඳවා ගන්නා කරුණා පාර්ශවය" යන වාර්ථාව දැක ගැනීමට "http://hrw.org/reports/2007/srilanka0107" වෙබ් අඩවියට යන්න.**